විදේශ රැකියා අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා මිලගණන් කැඳවීමයි.

අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ භාවිතයෙන් ඉවත් කරන ලද පරිගණක ආශ්‍රිත උපාංග, සේප්පු හා කාර්යාලයීය උපකරණ අපහරණය කිරීමට නියමිතව ඇත. අපහරණය කිරීමට නියමිත මෙම අයිතමයන් 2017.12.18 දින සිට 2018.01.04 දින දක්වා කාර්යාලීය දිනයන්හිදී පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා, ඉහත ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

<u>විස්තර හා කොන්දේසි:-</u>

1. අදාල අයිතම ලැයිස්තුව කාර්යාංශයේ නිල වෙබ් අඩවියේ පළකර ඇත.
2. මිලගණන් ඉදිරිපත් කිරීමේදී එක් එක් තොගයක් සඳහා මුළු පිරිවැය සඳහන් කළ යුතුය. අයිතම වෙන් වෙන්ව විකිණීම සිදු නොකරනු ලබන අතර, තෝරාගනු ලබන ගැනුම්කරු/ගැනුම්කරුවන් විසින් අයිතම තොග 03 ම හෝ තොග 01 ක් සම්පූර්ණයෙන් මිලදී ගැනීම සිදුකළ යුතුය.
3. ගැනුම්කරුවන් විසින් 2017.12.18 දින සිට 2018.01.04 දින දක්වා කාර්යාලයීය දිනයන්හි පෙ.ව. 09.00 ත් ප.ව. 03.00 ත් අතර කාලය තුල දී ඉහත ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශය වෙත සිදුකරන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු සහ ආපසු නොගෙවනු ලබන රු.1,000.00 ක මුදලක් ගෙවීම් කිරීමෙන් පසු මිලගණන් ඉදිරිපත් කිරීමට අදාල ටෙන්ඩර් ලේඛන ලබා ගත හැකිය.
4. ඔබගේ මිලගණන් සඳහන් කරන ලද එම ටෙන්ඩර් පත්‍රය ලිපි කවරයක බහා මුද්‍රා තබා, එහි වම්පස ඉහළ කෙළවරෙහි **"භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා මිලගණන් කැඳවීම - PR/02/19-01"** යනුවෙන් සඳහන් කර 2018.01.05 දින පෙ.ව. 11.00 ට හෝ ඊට ප්‍රථම ඉහත ලිපිනයෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයේ 2 වන මහලේ සාමාන්‍යාධිකාරි අංශයේ තබා ඇති ටෙන්ඩර් බහාළුමෙහි තැන්පත් කළ යුතුය. එම වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.
5. ලංසු ලේඛන විවෘත කිරීම 2018.01.05 දින පෙ.ව. 11.00 ට සිදු කරනු ලබන අතර, අදාල අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලය පැවරූ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.
6. තෝරාගත් ඉල්ලුම්කරු වෙත ඒ බව ලිඛිතව දැනුම්දෙනු ලබන අතර, එම ලිපිනයෙහි සඳහන් දින සිට සතියේ වැඩ කරන දින 07 ක් ඇතුළත අදාල භාණ්ඩ තොගය මිලදී ගැනීම වෙනුවෙන් එම ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මුළු මුදල කාර්යාංශයේ මුදල් අංශය වෙත ගෙවීම් කර, ඊට අදාල ලදුපත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මුළු භාණ්ඩ තොගය ඉවත් කර ගැනීමට කටයුතු කළ යුතුය.
7. මේ හා සම්බන්ධව වැඩිදුර විස්තර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමණාකරු - ප්‍රසම්පාදන වෙතින් පහත දුරකථන අංකයෙන් විමසීම් කළ හැකිය.
8. පූර්ව දැනුම් දීමකින් තොරව සියළුම ටෙන්ඩර්පත් හෝ ටෙන්ඩරයෙන් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමා සතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

**දුරකථන අංක :- 0112880550**
**ෆැක්ස් :- 0112880564**
**විද්‍යුත් තැපැල :- <u>supply@slbfe.lk</u>**
**වෙබ් අඩවිය :- <u>www.slbfe.lk</u>**